00035

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**අධ්‍යාපන මනෝවිද්‍යාව – ESU3225**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. සිසුන්ගේ චර්යා අධ්‍යයනය කිරීමේදී යොදාගත හැකි නිරීක්ෂණ ආකාර තුන (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමාවියේ සිසුන් තුළ චිත්තවේගික නොසන්සුන්තාවක් ඇතිවීමට බලපෑ හැකි හේතු පහක් (05) දක්වන්න.

03. 'සුදානම' යන සංකල්පය ළමා සංවර්ධනයට අදාලව පැහැදිලි කරන්න.

04. සිසුන්ගේ මතක තබාගැනීම වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරුන්ට යොදාගත හැකි උපාය මාර්ග තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

05. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණවාදී න්‍යායට අනුව පුද්ගල පෞරුෂයේ කොටස් තුන (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ස්කිනර්ගේ ප්‍රකාරක - ආරෝපණ න්‍යාය පන්තිකාමරය තුළ යොදා ගත හැකි ආකාරය පැහැදිලි කිරීමට සුවිශේෂ නිදසුන් තුනක් (03) දක්වන්න.

07. පාඩමක් තුළ දී සිසුන්ගේ අවධානය රඳවා ගැනීමට ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් (03) පැහැදිලි කරන්න.

08. නවයෞවනයන් තුළ හටගන්නා චිත්තවේග සමාජ සම්මත ආකාරයට ප්‍රකාශ කිරීම දිරිගැන්වීමට ගුරුවරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාට විවිධ අවස්ථාවන්හි දී විවිධ අන්දමට ප්‍රයෝජනවත් වේ.

(i) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාට ප්‍රයෝජනවත් වන සුවිශේෂී අවස්ථා හතරක් (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් කළ එක් අවස්ථාවක් සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරයකුට මනෝවිද්‍යාත්මක දැනුම ප්‍රයෝජනවත් වන ආකාරය සුවිශේෂී උදාහරණ සහිතව (අවම වශයෙන් 3 ක්) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) මනෝවිද්‍යාඥයන් විසින් සිදුකරන ලද පර්යේෂණවලට අනුව පුද්ගල විවිධතා කෙරෙහි ආරය මෙන්ම පරිසරයද බලපාන බව හඳුනාගෙන ඇත. ආරයෙන් ලැබුණු කුසලතා වර්ධනය කිරීමට පාසල් පරිසරය දායක වියයුතු ආකාරය උදාහරණ සහිත (අවමවශයෙන් 3 ක්) පැහැදිලි කරන්න.

(ලකුණු 08)

10. ළමාවිය හා පරිණතවිය අතර සංක්‍රාන්ති කාලසීමාව නවයොවුන් විය ලෙස සැලකේ.

(i) නවයොවුන් විය පුද්ගලයකුගේ ජීවිතයේ සුවිශේෂී අවධියක් ලෙස සැලකීමට හේතු තුනක් (03) පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) නවයෞවන අවධිය තුළදී පුද්ගලයෙකු මුහුණ දෙන ගැටලු තුනක් (03) නිදසුන් ඇසුරින් කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ ගැටලු තුන (03) අවම කර ගැනීම සඳහා දෙමාපියන් දායක විය යුතු ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) 'පෙළඹීම' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) සිසුන් තුළ ඉගෙනීම සඳහා ස්වයං පෙළඹීමක් ඇති කිරීමට ප්‍රජානනවාදී ප්‍රවේශය, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට දායක කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(iii) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී 'සමස්තය සංජානනය' කිරීම සඳහා ගුරුවරයාට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් (03) නිදසුන් සහිතව පැහැදිලි කරන්න. නිදසුන් සැපයීමේ දී අදාල විෂය ක්ෂේත්‍රය හා පාඩම සඳහන් කිරීම අවශ්‍ය වේ. (ලකුණු 09)

12. (i) 'ඉගෙනුම' යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ඉගෙනීම පිළිබඳ විග්‍රහ කෙරෙන සමාජ ඉගෙනීම් න්‍යායන් තුනක් (03) නම් කර එම සමාජ ඉගෙනීම් න්‍යායන්ගේ පොදු මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 09)

(iii) සමාජ ඉගෙනුම් න්‍යායයන් පන්තිකාමරය තුළදී භාවිත කළ හැකි ආකාරය සුවිශේෂී නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායට අනුව ප්‍රජානන සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුන (03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(ii) ඉහත සඳහන් න්‍යායට අදාලව 'අනුවර්තනය' සහ 'සංවිධානය' යන ප්‍රජානන ක්‍රියාවලි දෙක පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ප්‍රජානන සංවර්ධනය පිළිබඳව පියාජේගේ සහ බ්‍රූනර්ගේ න්‍යාය අතර ඇති සමානකම් හා වෙනස්කම් තුන (03) බැගින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) විගොට්ස්කිගේ න්‍යායට අනුව ළමුන්ගේ ප්‍රජානන සංවර්ධනය සම්බන්ධ ගුරුවරයාගේ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

14. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් (02) සම්බන්ධව කෙටි සටහන් ලියන්න.

අ) ඉගෙනුම් මාරුව සුසාධ්‍ය (පහසු) කිරීම සඳහා ගුරුවරයකු විසින් අනුගමනය කළයුතු උපක්‍රම

ආ) සිසුන් තුළ යහපත් චිත්තවේග සංවර්ධනය සඳහා ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ග

ඇ) වියුක්ත චින්තන අවධියේ පසුවන සිසුන්ට ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී ගුරුවරුන් විසින් සැලසිය යුතු කරුණු

ඈ) ළමයකුගේ වැඩීම හා සංවර්ධනය කෙරෙහි බලපාන සාධක (ලකුණු 10 x 2 = 20)

\- හිමිකම් ඇවිරිණි. -